# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

## 07 නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි

## බහුවරණ සහ කෙටි ප්‍රශ්න

1) ලක්සිරි විසින් ගඩොල් නිශ්පාදන ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර පහත තොරතුරු 2001.03.31 දිනෙන් අවසන් වර්ෂයට අදාල වේ.

| | රු. |
|---|---|
| මැටි මිලට ගැණුම් | 1,000,000 |
| මැටි තොග | |
| - 2020.03.31 | 120,000 |
| - 2021.03.31 | 150,000 |
| ගඩොල් පුළුස්සන්නාගේ වැටුප | 600,000 |
| ගඩොල් පෝරණුව සහිත ඉඩමට බිම් කුලී | 800,000 |
| මුරකරුගේ වැටුප | 500,000 |
| පුළුස්සා නොමැති තොග | |
| 2020.03.31 | 180,000 |
| 2021.03.31 | 120,000 |
| වර්ෂය තුල පුළුස්සා ඇති මුළු ගඩොල් ප්‍රමාණය ඒකක | 150,000 |

1. ලක්සිරි ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය කොපමණද ?
   (1) රු. 1,030,000
   (2) රු. 1,570,000
   (3) රු. 1,630,000
   (4) රු. 2,370,000
   (5) රු. 2,430,000

2. මුළු නිෂ්පාදන පිරිවැය කොපමණද ?
   (1) රු. 1,570,000
   (2) රු. 1,630,000
   (3) රු. 2,870,000
   (4) රු. 2,930,000
   (5) රු. 2,990,000



වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

3. ඒකකයක නිෂ්පාදන පිරිවැය කොපමණද ?
   (1) රු. 10.47
   (2) රු. 10.87
   (3) රු. 19.13
   (4) රු. 19.53
   (5) රු. 25.27

2) සමාගමකට අදාලව පහත තොරතුරු ඔබ වෙත දී ඇත.

| | රු' 000 |
|---|---|
| පරිභෝජනය කළ ද්‍රව්‍ය පිරිවැය | 2,000 |
| සෘජු වේතන | 800 |
| සෘජු වෙනත් | 400 |
| නොනිමි තොග වැඩි වීම් | 100 |
| පොදුකාර්ය පිරිවැය | 500 |

සමාගම නොනිමි තොග නිෂ්පාදන පිරිවැයට අගය කරන අතර, පොදුකාර්ය පිරිවැයෙන් ½ ක් නිෂ්පාදනයට අදාල වේ.

1. ඉහත ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය කොපමණද ?
2. නිෂ්පාදන පිරිවැය කොපමණද ?
3. ඒකක 10,000 ක් නිපදවූයේ නම්, ඒකකයක පිරිවැය කොපමණද ?
4. ඒකකයක පිරිවැයට 10 % ක ලාභයක් එකතු කරමින් විකුණුම් කරයි නම්, ඒකකයක විකුණුම් මිල කොපමණද ?

3) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන ව්‍යාපාරයක ප්‍රාථමික පිරිවැය හා මුළු නිෂ්පාදන පිරිවැය පිළිවෙලින් රු. 550,000 ක් හා රු.1,850,000 ක් විය. 2020.03.31 සහ 2021.03.31 දිනයන්ට අදාළ නිෂ්පාදන පිරිවැයට මිනුම් කරන ලද නොනිමි තොග පිළිවෙලින් රු.150,000 ක් හා රු.210,000 ක් විය. 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය කොපමණද ?
   (1) රු. 340,000
   (2) රු. 550,000
   (3) රු. 1,300,000
   (4) රු. 1,360,000
   (5) රු. 1,910,000

4) පහත තොරතුරු නිෂ්පාදන ව්‍යාපාරයක 2021 මාර්තු මාසයට අදාළ වේ.

| | | (රු '000) |
|---|---|---|
| නොනිමි තොග වැඩිවීම (මුළු නිෂ්පාදන පිරිවැය මත) | | 150 |
| නිමි තොග අඩුවීම | | 200 |
| පරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැය | | 3,350 |
| සෘජු වැටුප් | | 95 |
| පොදු කාර්ය පිරිවැය | - කර්මාන්තශාලාව | 75 |
| | - කාර්යාලය | 20 |
| නිමි තොග මිලට ගැනුම් | | 1,200 |

2021 මාර්තු මාසයට අදාල ප්‍රාථමික පිරිවැය හා විකුණුම් පිරිවැය කොපමණද ?

| | ප්‍රාථමික පිරිවැය (රු'000) | විකුණුම් පිරිවැය (රු'000) |
|---|---|---|
| (1) | 3,295 | 3,370 |
| (2) | 3,295 | 4,570 |
| (3) | 3,445 | 4,770 |
| (4) | 3,445 | 3,370 |
| (5) | 3,350 | 4,770 |

5) පහත වගන්ති හරි ද වැරදි ද යන්න දක්වන්න.

1. සෘජු ද්‍රව්‍ය, සෘජු ශ්‍රමය හා සෘජු වෙනත් යන තුනෙහි එකතුව ප්‍රාථමික පිරිවැය වේ. ( )
2. මුළු නිෂ්පාදන පිරිවැය, ප්‍රාථමික පිරිවැය හා නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය යන කොටස් දෙකෙන් සමන්විත වේ. ( )
3. නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය, පරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැයෙහි කොටසක් වේ. ( )
4. නිෂ්පාදන ව්‍යාපාරයක විකුණු බඩු වල පිරිවැය තුළ මුළු නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ඇතුළත් වේ. ( )
5. නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ලාභය ගණනය කිරීමේදී නොසලකා හැරේ. ( )
6. පරිභෝජනය කල ද්‍රව්‍ය පිරිවැයට ප්‍රතිශතයක් ලෙස ලාභය ගණනය කරයි. ( )

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

# ගිණුම්කරණය

## අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා විෂයානුබද්ධ සංචිතය

**07**

## නිෂ්පාදන ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරයි
## ව්‍යුහගත ප්‍රශ්න

01. පහත තොරතුරු "ආලෝක බේකරි නිෂ්පාදන" ව්‍යාපාරයෙන් උපුටා ගන්නා ලදි.

| | |
|---|---|
| අමුද්‍රව්‍ය තොග 2020.04.01 දිනට | රු. 150,000 |
| 2021.03.31 දිනට | රු. 180,000 |
| අමුද්‍රව්‍ය මිලදී ගැණුම් | රු. 800,000 |
| අමුද්‍රව්‍ය ගෙන ඒමේ කුලී | රු. 20,000 |
| පුරස්කාර ගෙවීම් | රු. 50,000 |
| සෘජු ශ්‍රමය | රු. 200,000 |
| කම්හල් කුලී | රු. 80,000 |
| කම්හල් විදුලිය | රු. 20,000 |
| වේතන | රු. 120,000 |
| යන්ත්‍ර ක්ෂය | රු. 10,000 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | රු. 25,000 |
| ආරම්භක නොනිමි තොග (2020.04.01 දිනට) | රු. 30,000 |
| වක්‍ර ද්‍රව්‍ය වියදම් | රු. 15,000 |
| අමුද්‍රව්‍ය ආපසු යැවුම් | රු. 7,000 |
| අනෙකුත් පොදු කාර්ය වියදම් | රු. 26,000 |

පහත අමතර තොරතුරු ද සපයා ඇත.

i. 2021.03.31 දිනට නොනිමි ද්‍රව්‍ය තොගය රු. 25,000 ක් වේ.
ii. කම්හල් විදුලිය රු. 5,000 ක් ගෙවිය යුතු වේ.
iii. වේතන තුල විකුණුම් සේවක වේතන රු. 20,000 ක් ඇතුලත් වන අතර, ඉතිරි වේතන කම්හල් සේවක වේතන වේ.
iv. අමුද්‍රව්‍ය තොගවලින් රු. 7,000 ක් විනාශ වී ඇති අතර, ඒ සඳහා කිසිදු සටහනක් තබා නැත.
v. කම්හල් කුලී රු. 10,000 ක් ඉදිරි වර්ෂයට අදාල වේ.
vi. අමුද්‍රව්‍ය ගැණුම් රු. 15,000 ක ඉන්වොයිසියක් සම්පූර්ණයෙන් මඟ හැරී ඇත.
vii. යන්ත්‍ර නඩත්තු වියදම් රු. 3,000 ක් ගෙවිය යුතුව ඇත.
viii. වර්ෂය තුළ නිෂ්පාදිත ඒකක සංඛ්‍යාව 100,000 ක් වේ.

අවශ්‍ය වන්නේ,

1) 2021.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය
2) ඒකකයක නිෂ්පාදන පිරිවැය
3) එක් ඒකකයක විකුණුම් මිල තීරණය කරනු ලබන්නේ පිරිවැය මත 25% ක ලාභ ප්‍රතිශතයක් තබා ගෙන නම් ඒකකයක විකුණුම් මිල
4) වර්ෂය තුළ ඒකක 80,000 ක් විකුණුවේ නම් ඉතිරි තොගයේ පිරිවැය ( ආරම්භක නිමි තොග තිබුනේ නැතැයි සලකන්න)

වාණිජ හා ව්‍යාපාර අධ්‍යයන ශාඛාව

2. “සුරංජි යෝගට් නිෂ්පාදන ආයතනයේ” 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත තොරතුරු සපයා ඇත.

| | |
|---|---|
| ආරම්භක අමුද්‍රව්‍ය තොග (2021.03.31 දිනට) | කිරි ලීටර් 300 එකක් රු. 100 බැගින්<br>ජෙලටින් රු. 1,000<br>පළතුරු තොග රු. 3,000 |
| අමුද්‍රව්‍ය ගැනුම් | කිරි ලීටර් 12,000 එකක් රු. 130 බැගින්<br>ජෙලටින් වියදම රු. 25,000<br>පළතුරු සහ අනෙකුත් ද්‍රව්‍ය රු. 30,000 |
| සෘජු ශ්‍රම වියදම | රු. 450,000 |
| සෘජු වෙනත් වියදම් | රු. 50,000 |
| සුපරීක්ෂණ වේතන | රු. 169,200 |
| කම්හල් කුලී | රු. 360,000 |
| කම්හල් විදුලිය | රු. 20,000 |
| මුරකරු වේතන (කම්හල්) | රු. 60,000 |
| වක්‍ර ද්‍රව්‍ය වියදම් | රු. 92,300 |
| යන්ත්‍ර ක්ෂය | රු. 10,000 |
| යන්ත්‍ර නඩත්තු වියදම් | රු. 30,000 |
| අනෙකුත් පොදුකාර්ය | රු. 58,000 |

පහත අමතර තොරතුරු නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය සෑදීමේදී සැලකිල්ලට ගත යුතුවේ.

i. කම්හල් විදුලිය රු. 5,000 ක් උපචිත වන අතර, කම්හල් කුලී රු. 10,000 ක් ඉදිරි වර්ෂයට අදාල වේ.
ii. වර්ෂය තුළ මිලදී ගත් කිරි ලීටර් 50 ක් භාවිතයෙන් ඉවත් කර ඇත.
iii. 2022.03.31 දිනට අමුද්‍රව්‍ය ඉතිරි තොග තුල ඇතුලත් වී ඇති ද්‍රව්‍ය පහත දැක්වේ.
    i. කිරි ලීටර් 100
    ii. අනෙකුත් ද්‍රව්‍ය රු. 5,000
iv. එක් කිරි ලීටරයකින් යෝගට් 06 ක් නිෂ්පාදනය කළ හැකිවේ.
v. 2021.04.01 දිනට නිමි තොගය තුළ යෝගට් 150 ක් තිබූ අතර එහි පිරිවැය රු. 4,500 ක් වේ.
vi. වර්ෂය තුළ නිපද වූ තොගයෙන් යෝගට් 50 ක් විනාශ වී ඇත.

අවශ්‍ය වන්නේ,

1) 2022.03.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිෂ්පාදන පිරිවැය ප්‍රකාශනය
2) එක් යෝගට් කෝප්පයක මිල
3) යෝගට් ඒකක 71,500 ක් විකුණුවේ නම් හා ඒකකයක මිල රු. 70 ක් වූයේ නම් දළ ලාභය සොයන්න.

වාණිජ තොරතුරු අධ්‍යයන ශාඛාව